2026-04-27 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

01. **මාලදිවයින් ජනරජයේ ජනාධිපති අතිගරු ආචාර්ය මොහොමඩ් මුයිසු මැතිතුමාගේ ශ්‍රී ලංකා රාජ්‍ය සංචාරය අකරතුර අවබෝධතා ගිවිසුම්වලට අත්සන් කැබීම**

ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ ආරාධනයක් මත මාලදිවයින් ජනරජයේ ජනාධිපති අතිගරු ආචාර්ය මොහොමඩ් මුයිසු මැතිතුමා 2026-05-03 දින සිට 2026-05-05 දින දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වීමට නියමිතව ඇත. දෙරට අතර සහයෝගිතාව වර්ධනය කර ගනිමින් ක්ෂේත්‍රයන් ගණනාවක් ආවරණය වන අයුරින් එකී රාජ්‍ය සංචාරය අතරතුර පහත සඳහන් අවබෝධතා ගිවිසුම්වලට අත්සන් තැබීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

* පුහුණු වැඩසටහන් සංවිධාන කිරීම, කාර්යමණ්ඩල හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ඒකාබද්ධ පර්යේෂණ පැවැත්වීමට අදාළව මාලදිවයින් ජනරජයේ ආරක්ෂක සහ ජාතික සේවා අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම.

* ගුරුවරුන් හා පාසල් නායකයින් පුහුණු කිරීම සහ වෘත්තීය සංවර්ධන ක්ෂේත්‍රයේ සහයෝගිතාව සඳහා මාලදිවයිනේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ කුසලතා සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුම.

* මාලදිවයින් ජනරජයේ සෞඛ්‍ය, පවුල් සහ සුබසාධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලය අතර අධ්‍යයන සහයෝගිතාව පිළිබඳව වන අවබෝධතා ගිවිසුම.

* මාලදිවයින් ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳව වන අවබෝධතා ගිවිසුම.

* මාලදිවයින් ජනරජයේ ජාතික අධිලේඛනාගාරය සහ ශ්‍රී ලංකාවේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව අතර ලේඛනාරක්ෂක ක්ෂේත්‍රයේ සහයෝගිතාව පිළිබඳව වන අවබෝධතා ගිවිසුම.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன வீதி, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු තෙ T - (+94 11) 2515759
ෆැ පෙ F - (+94 11) 2514753
ඊ ඉ E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

* මාලදිවයින් ජනරජයේ තරුණ බලගැන්වීම් සහ යෝග්‍යතාව පිළිබඳ අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය අතර ක්‍රීඩා සහ තරුණ සංවර්ධනය සඳහා වන අවබෝධතා ගිවිසුම.

02. **පොදු රාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර-අක්තපත්‍ර පිළිබඳ ප්‍රතිපත්තියක් සහ රාමුවක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම (Developing and Implementing a Policy and Framework on Micro-Credentials in Sri Lanka) සඳහා කාර්ය නිර්දේශය අනුදේශ සකස් කිරීම**

ක්ෂුද්‍ර-අක්තපත්‍ර (Micro-Credentials) යනු වේගවත් තාක්ෂණික වෙනස්කම් සහ විකාශනය වන ශ්‍රම වෙළෙඳපොළ ඉල්ලුමට ප්‍රතිචාර වශයෙන් යාවජීව ඉගෙනීම, ශ්‍රම බලකායේ කුසලතා වැඩිදියුණු කිරීම සහ සේවා නියුක්තිය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පිළිගනු ලබන ඵලදායී යාන්ත්‍රණයකි. ඊට අනුගතව උසස් අධ්‍යාපන සහ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු පද්ධති ශක්තිමත් කිරීම පිණිස සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සුදුසුකම්වල ජාත්‍යන්තර සංසන්දනාත්මක බව හා පිළිගැනීම වැඩි දියුණු කිරීම පිණිස ජාතික ක්ෂුද්‍ර-අක්තපත්‍ර පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සහ විෂය සම්භාර හුවමාරු රාමුවක් (Credit Transfer Framework) ස්ථාපිත කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, පොදු රාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් සංවිධානය (Commonwealth of Learning) සමඟ සහයෝගයෙන් එකී කාර්යය ඉටු කිරීම සඳහා කාර්ය නිර්දේශ අනුදේශ (Terms of Reference) සම්පාදනය කිරීම පිණිස 2026 මැයි මාසයේදී කොළඹදී වැඩමුළුවක් පැවැත්වීමට යෝජනා වී ඇත. ඒ අනුව, පොදු රාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් සංවිධානයේ සහයෝගිතාවයෙන් සහ පූර්ණ මූල්‍ය දායකත්වයෙන් ශ්‍රී ලංකාව සඳහා ක්ෂුද්‍ර-අක්තපත්‍ර පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සහ රාමුවක් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් සංවිධානය සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය අතර ගිවිසුමකට අත්සන් තැබීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

03. **නාගරික සංවර්ධන අධිකාරියට අයත් කොළඹ 10, මරදාන පාරේ ඉඩම් කොටසක් 50 අවුරුදු බදු පදනම මත බැහැර කිරීම සඳහා ආයෝජන යෝජනා කැඳවීම**

නාගරික සංවර්ධන අධිකාරිය සතු සංවර්ධන කටයුතු සඳහා යොදා ගෙන නොමැති ඉඩම් වඩාත් සුදුසු සංවර්ධන කටයුතු සඳහා යෝජනා කිරීම පිණිස 2025-04-28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී විශේෂ කමිටුවක් පත් කරනු ලැබ ඇත. එම කමිටුව විසින් නාගරික සංවර්ධන අධිකාරිය සතු කොළඹ 10, මරදාන පාරේ පිහිටි අක්කර 01 රූඩ් 01 පර්චස් 12.4ක ඉඩම් කොටසක් තොරතුරු තාක්ෂණය ආශ්‍රිත නව

27/04 2026 9:34PM FAX 0112323730
0002/0008

නිපැයුම් පදනම් කරගත් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජන යෝජනා කැඳවීම පිණිස නිර්දේශ කරනු ලැබ තිබේ. ඒ අනුව, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාවක් සැලකිල්ලට ගෙන, එකී ඉඩම් කොටස ශ්‍රී ලාංකීය තාක්ෂණ විද්‍යාඥයන් හට දේශීය වෙළෙඳපොළ ඉලක්ක කර ගත් බුද්ධිමය තාක්ෂණික නිමැවුම් හා සේවා නිෂ්පාදන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා උනන්දුවක් දක්වන ආයෝජකයන් වෙතින් ආයෝජන යෝජනා කැඳවීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

04. **දඹුල්ල මූලික රෝහල සංවර්ධනය සහ වැඩිදියුණු කිරීම සඳහා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතට පවරා ගැනීම**

මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන 'ඒ' ශ්‍රේණියේ රෝහලක් වන දඹුල්ල මූලික රෝහල ප්‍රධාන වශයෙන් මාතලේ, අනුරාධපුර, පොළොන්නරුව සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල 230,000ක් පමණ වන ජනතාවට සේවය සපයනු ලබයි. එම රෝහලේ මූලික සත්කාර සේවාවන් මෙන්ම ප්‍රධාන විශේෂඥ වෛද්‍ය සේවාවන්ද සපයනු ලබන අතර, එහි ඇඳන් ධාරිතාව 354ක් වේ. මහජනතාවගේ සෞඛ්‍ය සේවා සඳහා වන ඉල්ලුම ඉහළ ප්‍රමිතියකින් යුතුව සපුරාලීමට ප්‍රමාණවත් ඉඩකඩ සහ වැඩිදියුණු කරන ලද යටිතල පහසුකම් සැපයීම සහතික කිරීමට හැකිවන පරිදි සහ 2022-2032 දඹුල්ල සංවර්ධන මහා සැලැස්ම අනුව, රෝහල පිහිටි ඉඩම ආර්ථික සංවර්ධන අරමුණු සඳහා යොදා ගැනීමට හැකි වන පරිදි එම රෝහල වෙනත් ස්ථානයක ප්‍රතිස්ථාපනය කිරීමට යෝජනා වී තිබේ. ඒ සඳහා අක්කර 05ක පමණ ඉඩම් කොටසක් මේ වන විට අත්කර ගනු ලැබ ඇත. එම රෝහල නැවත ස්ථානගත කිරීම සඳහා වන පිරිවැය රුපියල් බිලියන 7ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තුගත කර ඇති අතර, එම පිරිවැය දැරීමට මධ්‍යම පළාත් සභාවට හැකියාවක් නොමැති බැවින් එකී රෝහල මධ්‍යම රජයට පවරාගෙන සංවර්ධනය කිරීම සඳහා මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා විසින් එකඟතාව ලබා දී තිබේ. ඒ අනුව, දඹුල්ල මූලික රෝහල, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතට පවරා ගැනීම පිණිස සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය සඳහා ඩිජිටල් ඒකකයක් ස්ථාපිත කිරීම**

ජාතික සන්නිවේදනය, ඩිජිටල් පරිවර්තනය, නව්‍යකරණය සහ මහජනතාවට නිවැරදි තොරතුරු ලබා දීම යන ආයතනික අරමුණුවලට අනුගතව අනාගතයට සාර්ථකව මුහුණ දිය හැකි ආකාරයට ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය ශක්තිමත් කිරීම සඳහා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ සංවිධාන ව්‍යුහය තුළ නිශ්චිත වගකීම් සහිතව ඩිජිටල් කටයුතු සඳහාම වෙන් වූ මානව හා භෞතික සම්පත් සහිත නිල

27/04 2026 9:34PM FAX 0112823730
0003/0008

ඩිජිටල් ඒකකයක් ස්ථාපිත කිරීම සුදුසු බව හඳුනා ගනු ලැබ ඇත. එමඟින්, ඩිජිටල් අන්තර්ගතයන් විධිමත් පරිදි කළමනාකරණය කිරීම, ඩිජිටල් ප්‍රවෘත්ති බෙදා හැරීම, ප්‍රේක්ෂක සබඳතාව පවත්වා ගැනීම, දත්ත විශ්ලේෂණය වැනි අවස්ථාවන් රූපවාහිනී ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයට හිමිවනු ඇත. ඒ අනුව, උපායමාර්ගික ඒකකයක් වශයෙන් යෝජිත ඩිජිටල් ඒකකය ස්ථාපිත කිරීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **පෙර පුරවා ඇති ඇඩලිමැබ් එන්නත් මිලිග්‍රෑම් 40න් (40mg), මිලිලීටර 0.8 (0.8ml) සිරින්ජර 6,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

වැඩිහිටියන් සහ ළමුන් තුළ ඇති විවිධ දිගුකාලීන සහ ස්වයං ප්‍රතිශක්ති රෝග සඳහා ප්‍රතිකාර කිරීමට භාවිත කරනු ලබන ඇඩලිමැබ් එන්නත් සිරින්ජර 6,000ක් මිල දී ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 04ක් ලැබී තිබේ. ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව සාරාංශුකූල ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වූ ඉන්දියාවෙහි Reliance Life Sciences Pvt Ltd. (Manufacturer - Reliance Life Sciences Pvt Ltd., India) වෙත මුළු පිරිවැය සහ නැව් ගාස්තු ඇමෙරිකානු ඩොලර් 225,000ක මුදලකට එකී ප්‍රසම්පාදනය පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට ලක් වූ පූජනීය ස්ථාන යළි ගොඩනැංවීමේ වැඩසටහන**

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ආපදාවන්ට ලක්ව ඇති සියලු ආගමික ස්ථාන යළි ඉදිකර හෝ අලුත්වැඩියා කර, ආගමික ස්ථානයන්හි කටයුතු යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා සහනයක් ලබා දීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින ආගමික කටයුතු දෙපාර්තමේන්තු විසින් ඒකාබද්ධ වැඩපිළිවෙලක් සැලසුම් කර ඇත. ඒ අනුව, එකී ආගමික මධ්‍යස්ථාන නැවත ගොඩනැඟීම සඳහා පහත සඳහන් පරිදි සහන සැලසීම පිණිස බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* පූර්ණ වශයෙන් විනාශයට පත් වූවද, නැවත එම ස්ථානයේම ගොඩනැංවීමට සුදුසු පූජනීය ස්ථාන වෙනුවෙන් ආවාස ගෘහය, ධර්ම ශාලාව, ප්‍රධාන කෝවිල, පල්ලිය, සනීපාරක්ෂක පහසුකම්, ජලය හා විදුලිය සඳහා ප්‍රමුඛත්වය ලබා දී එකී ඉදිකිරීම් කටයුතු සඳහා උපරිම රුපියල් මිලියන 7.5 දක්වා ලබා දීම.

27/04 2026 9:35PM FAX 0112823730
0004/0008

* අර්ධ වශයෙන් විනාශයට පත් වූ පූජනීය ස්ථාන යළි ප්‍රතිසංස්කරණය කිරීමට උපරිම රුපියල් මිලියන 5 දක්වා ලබා දීම.

* සුළු වශයෙන් හානි වූ පූජනීය ස්ථාන යළි ප්‍රතිසංස්කරණය කර දීම.

08. **කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුරට පත් කිරීම**

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති ලෙස කටයුතු කළ එච්.එම්.ජේ.එම්.හේරත් මහතා 2026-04-10 දින සිට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් තනතුරට පත් වී ඇති බැවින්, මේ වන විට කෑගල්ල දිස්ත්‍රික් ලේකම්/දිසාපති තනතුර පුරප්පාඩු වී ඇත. ඒ අනුව, එකී තනතුර සඳහා රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති ලෙස දැනට සේවය කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි කේ.ජී.එස්.නිශාන්ත මහතා වහාම ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම පිණිස රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **දිවිවා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ආපදාවන්ගෙන් විපතට පත්ව සුරක්ෂිත මධ්‍යස්ථාන, කුඩාරම්, ඥාති නිවාසවල ජීවත්වන පවුල් සඳහා අන්තර්කාලීන නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

දිවිවා සුළි කුණාටු තත්ත්වයේ බලපෑම හේතුවෙන් ඇති වූ ආපදාවන්ගෙන් පූර්ණ නිවාස හානි 6,088ක් සහ අර්ධ නිවාස හානි 115,179ක් වාර්තා වී තිබේ. මෙම පවුල් අතරින් 2026-04-22 වන විට පවුල් 494ක් දිවයිනේ දිස්ත්‍රික්ක 04ක පවතින සුරක්ෂිත මධ්‍යස්ථාන 20ක් තුළ රැඳී සිටින අතර, තවත් පවුල් සංඛ්‍යාවක් කුඩාරම්වල සහ ඥාති නිවාසවල රැඳී සිටී. එමෙන්ම, නායයෑම් හා ගංවතුර හේතුවෙන් තම නිවස අහිමි වී පදිංචි වීමට නිවසක් නොමැති පවුල් වෙත නව නිවසක් ඉදිකර ගන්නා තෙක් කුලී නිවසක පදිංචි වීම සඳහා රුපියල් 25,000/-ක මාසික කුලී දීමනාවක් ලබා දීමට පියවර ගෙන ඇති නමුත්, එම ප්‍රදේශවලින් කුලී නිවාස සපයා ගැනීම ගැටලුවක් බවට පත්වී ඇති බව ද නිරීක්ෂණය වී තිබේ. ඒ අනුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ඉදිරිපත් කර ඇති නිවාස සැලැස්ම අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ශ්‍රම දායකත්වය යොදාගනිමින් දිවිවා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ආපදාවන්ගෙන් නිවාස හානි වීම හේතුවෙන් කෑගල්ල, මහනුවර, නුවරඑළිය හා බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි සුරක්ෂිත මධ්‍යස්ථාන, කුඩාරම් හා ඥාති නිවාසවල පදිංචිව සිටින පවුල් 1,000ක් සඳහා ස්ථිර නිවාස ඉදිකර පදිංචි වන තෙක් අන්තර්කාලීන නිවාස ඉදි කර දීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

27/04 2026 9:35PM FAX 0112823730
0005/0008

10. **රාජ්‍ය ආයතන සඳහා තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම් මත සේවයට බඳවාගෙන ඇති සේවකයින්ගෙන් ස්ථිර පත්වීම් ලබා දීම**

රාජ්‍ය සේවය, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතනවල සේවය සඳහා තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම් මත බඳවාගෙන ඇති සේවකයන් 9,800කට ආසන්න ප්‍රමාණයක් සේවයේ යෙදී සිටින බව සැලකිල්ලට ගෙන, 2026 වර්ෂය සඳහා වන අයවැය යෝජනා අංක 33.11 මඟින් ඔවුන්ට ස්ථිර පත්වීම් ලබා දීමට ගරු ජනාධිපතිතුමා විසින් යෝජනා කරන ලදී. ඒ අනුව, එම සේවකයින් වෙත ස්ථිර පත්වීම් පිරිනැමීමට අදාළ විධිවිධාන ඇතුළත් වක්‍රලේඛය නිකුත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පලාත් පාලන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **2026 අංක 01 දරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංඛ්‍යාලේඛන සහ තොරතුරු රැස් කිරීම පිළිබඳ රීති පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි නෛතික කාර්යයන් හා ප්‍රධාන කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා බාහිර පාර්ශ්වයන් වෙතින් සංඛ්‍යාලේඛන සහ තොරතුරු එක්රැස් කිරීම සිදු කරනු ලබයි. 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන යටතේ එලෙස එක්රැස් කරනු ලබන තොරතුරු සහ එම තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවට සැපයිය යුතු ආකෘතිය, වාර්තා කිරීමේ නියමයන්ට යටත් කැනැත්තන්, අදාළ රහස්‍යභාවය පිළිබඳ කාරණා සහ එකී නියමයන් උල්ලංඝනය කිරීමකදී ගනු ලැබිය හැකි පරිපාලනමය ක්‍රියාමාර්ග නියම කිරීම සඳහා ප්‍රතිපාදන සලසා තිබේ. ඒ අනුව, එකී විධිවිධාන යටතේ 2026 අංක 01 දරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංඛ්‍යාලේඛන සහ තොරතුරු රැස් කිරීම පිළිබඳ රීති අංක 2479/54 දරන 2026-03-12 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී රීති අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **2025 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ විධිවිධාන පරිදි පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද විගණකාධිපති විසින් විගණනය කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශ අදාළ මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් මාස 04ක් තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, මුදල් විෂය භාර අමාත්‍යවරයා

27/04 2026 9:35PM FAX 0112823730
0006/0008

විසින් එම වාර්තාව ලැබී දින 14ක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. 2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. 2025 වසර තුළ මහ බැංකුවේ ආයතනික කාර්යසාධනය පිළිබඳ විවරණයක් එකී වාර්තාව තුළ අන්තර්ගත වේ. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ 2025 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ සහ මෙහෙයුම් වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

****

27/04 2026 9:35PM FAX 0112323730
0007/0008